# ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා අදහස් හා යෝජනා ලබා ගැනීම

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් සියලුම ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි ප්‍රතිපත්ති සම්පාදනය සඳහා 1991 අංක 19 දරන පාර්ලිමේන්තු පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කර ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ජාතික අවශ්‍යතා හා ගෝලීය ප්‍රවණතා කෙරෙහි අවධානය ඇතිව ඉදිරි දශකයට උචිත අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ප්‍රතිපත්ති සමාලෝචන ක්‍රියාවලියේ නිරතව සිටී.

ඒ අනුව ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන පද්ධතිය දියුණු කිරීම උදෙසා වර්තමාන උසස් අධ්‍යාපන පද්ධතියේ ක්‍රියාත්මක ප්‍රතිපත්ති හා සැලසුම්වල සිදුකළ යුතු වෙනස්කම් සහ නව ප්‍රතිපත්ති හා යෝජනා පිළිබඳව මහජනතාවගෙන්, විශේෂඥයන්ගෙන්, වෘත්තිකයන්ගෙන්, ආයතන සහ සංවිධානවලින් අදහස් හා යෝජනා ලබා ගැනීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

ඒ සඳහා දායකවීමට ඔබගේ ලිඛිත යෝජනා පහත දැක්වෙන අංශ යටතේ අප වෙත ලබා දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

1. විශ්වවිද්‍යාල ප්‍රවේශය, පොදු මූලධර්ම
2. ඉල්ලුම ඇති නව විෂය/විෂයය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම.
3. පශ්චාද් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ.
4. අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල සංවර්ධනය.
5. ශිෂ්‍ය සුභසාධනය සහ විනය.
6. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනයන්හි උසස් අධ්‍යාපන ප්‍රවේශයන් පුළුල් කිරීම.
7. මුල්‍ය හා සම්පත් කළමනාකරණය.
8. වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය.
9. රාජ්‍ය විශ්වවිද්‍යාලයන්හි ගුණාත්මකභාවය සහතිකකරණය හා ප්‍රතීතනය.
10. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද උපාධි පිරිනමන රාජ්‍ය නොවන ආයතනයන්හි ගුණාත්මකභාවය සහතිකකරණය සහ ප්‍රතීතනය.
11. උසස් අධ්‍යාපනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තිමය යෝජනා.

ලිඛිත යෝජනා 2017 නොවැම්බර් මස 11 වන දිනට පෙර සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 126, නාවල පාර, නුගේගොඩ, යන ලිපිනයට තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල් මගින් හෝ ෆැක්ස් මගින් යොමු කළ හැකිවන අතර, අතින් ගෙනවිත් ද බාරදිය හැකිය.

කරුණාකර ලියුම් කවරයේ/ආවරණ පිටුවේ වම් පස ඉහළ කෙළවරේ "උසස් අධ්‍යාපනය පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා යෝජනා" යනුවෙන් සදහන් කරන්න.

අදහස් හා යෝජනා ලබා දුන් අය අතරින් තෝරා ගත් අයගෙන්, කණ්ඩායම්වලින්, වාචික අදහස් ලබා ගැනීම සඳහා කැඳවීමට ද කොමිෂන් සභාව විසින් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

| |
|---|
| දැනට පවතින උසස් අධ්‍යාපන පද්ධතිය දියුණු කිරීම උදෙසා වූ ඔබගේ නව නිර්මාණශීලී අදහස් හා ප්‍රවේශයන් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව නිබඳවම අපේක්ෂා කරනු ලබයි. |

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 126, නාවල පාර, නුගේගොඩ, ශ්‍රී ලංකාව

දුරකථන : 94112815701-3
ෆැක්ස් : 94112816177-8
විද්‍යුත් තැපෑල : chnec@slt.lk
වෙබ් අඩවිය : www.nec.gov.lk

සභාපති,
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව